# කතාබහ

ජගත් ජේ එදිරිසිංහ

## යහ සමාජයක් ගොඩනැගීම

වතාවක් මෙල්බන් නගරයේ එක්තරා උත්සවයකට ආරාධිත අමුත්තු ලෙස සහභාගිවන්නට අපට අවස්ථාව ලැබුණා. සුපුරුදු ලෙසම මම උත්සවය ආරම්භ වන්නට නියමිත වේලාවට කලින් ශාලාවට ගියා. මා සිටි මේසයේ මා සමග අසුන් ගත්තේ තවත් අරාධිතයකු වූ ඉතා උස සිරුරක් ඇති ඉතා ප්‍රකට ප්‍රවීණ කලාකරුවෙක්. විවිධ සම්මානවලින් පුද ලද මේ කලාකරුවා මා සමග සංවාදයේ යෙදී සිටියා. නියමිත වේලාවට පසුවී විනාඩි 45 ක් පමණ ගත වුණත් උත්සවය ඇරඹුණේ නැහැ. අපේ කලාකරුවා ඒ ගැන මා සමග කතා කළේ කෝපයෙන්.

"මෙහෙම වෙලාව පමා කරලා උත්සව පටන් ගන්න එක නියමිත වෙලාවට එන අයට කරන නිග්‍රහයක්." ඔහු මා සමග කීවා. මාත් එයට එකඟ වුණා. "මේ වගේ වැරදි ගුණාග නිසා තමයි අපේ සමාජය තව තවත් පහළට යන්නෙ. මේ වැරදි වැඩ ඉවත් කරගන්නකල් අපට ඉදිරියට යාමක් නැහැ" ඔහු කිව්වා. ඒ විතරක් නෙවෙයි. අපේ සමාජයේ පවතින නොයෙකුත් වැරදි පුරුදු පිළිබඳ ඔහු දැඩි විවේචනයක් කළා. ඔහුගේ කතාව පිළිබඳව මා කොයිතරම් පැහැදුනාද කිව්වොත් ඒ ගැන සඳහන් කරලා පුවත්පතකට ලිපියක් පවා ලිව්වා.

ගිය අවුරුද්දෙ ලංකාවට ගිය වෙලාවෙ අපේ හිතවත් නිශ්ශංක දිද්දෙණිය මහතා ජෝන් ද සිල්වා රඟහලේ පැවති "පරාස්ස" නාට්‍යයේ දර්ශනයක් සඳහා සහභාගි වන්නයි මට ආරාධනා පතක් එවා තිබුණා. නාට්‍ය දර්ශනය සඳහා විශාල පිරිසක් සහභාගි වී සිටියා. මා කලින් සඳහන් කළ මෙල්බනයේදී මට හමු වූ ප්‍රවීණ කලාකරුවාත් නාට්‍ය සංවිධානයේ විශේෂ බරක් ගෙන කටයුතු කරනු මම දැක්කා.

විවේක කාලය ආවාම මම අසල වූ ආපන ශාලාවට ගියේ පිපාසයට මොනවා හරි බොන්න හිතාගෙනයි. ආපනශාලාවේ කවුන්ටරය ඉදිරියේ සෙනග පිරිලා හිටියා. පොඩියට පෝලිමකුත් හැදුණා. මාත් දැන් ටිකෙන් ටික ඉස්සරහට යනවා. මගේ වාරය ආවා විතරයි මට පිටිපස් සෙන් හිටි තවත් තුන් හතර දෙනෙකුටත් පිටුපස සිට දිග අතක් මගේ උරහිසටත් උඩින් කවුන්ටරයට දික්වුණා.

"ළමයා මට ඔය බීම බෝතලයක් දෙන්න" කටහඬ අර ප්‍රවීණයාගෙ. ඔහු අපි හැමෝටම කලින් බීම බෝතලය අරගෙන ගියා. මට මතක් වුණේ මෙල්බන් නගරයෙදි ඔහු මා සමග කළ කතාව. යහ සමාජයක් හැදීම ගැන අර තරම් එදා කතා කළ ප්‍රවීණයා ලංකාවෙදි පෝලිමක පිළිවෙලකට යන්නවත් නොදන්නා අයෙක් වුණේ කොහොමද කියලා මං තාමත් කල්පනා කරනවා. මෙල්බන් වල ලංකාවෙ මිනිස්සු නම් කවදාවත් පෝලිමක් පැනලා යනවා මම දැකලා නැහැ.

## බුදු සරණයි

නිලූ පෙරේරා ලියූ සටහනක් ඔබ සමග බෙදාගන්න හිතුවා. ලියල තියෙන්නෙ ඉංග්‍රීසියෙන් නිසා ඒ විදිහටම සටහන් කරන්නම්

**"There is no real value of "Budu Saranai .. anymore˜**

I recently went for a holiday in Sri Lanka. After I came back to Australia, I received text messages from some of my friends. Please read one of them below

"It was really nice to see u after such a long time. I can't forget all the fun we had and how much we laughed. Sometimes we all laugh thinking about the crazy things we did. We hope to see u again end of 2014 or early 2015. We promise that we will take u all around Sri Lanka. Everyone here said hello to you.
Love you and miss you'
BS
Love, Aruni Shenali Naomi

After typing so many words in full, they couldn't be bothered to type the most important and valuable words "BUDU SARANAI' in full. I could interpret BS as bull shit.

I find this BS in other communication channels as well, such as email and face book. When I chat with some of my friends on Facebook, most of them use acronyms BS for BUDU SARANAI. I find it really disappointing and disgraceful.

I don't think we should DEVALUE the word BUDU SARANAI. If we can't be bothered to use the full word "BUDU SARANAI— I don't think we should be bothered to bless someone BUDU SARANAI at all.

Nilu Perera

## මිහිර ට පනහයි

මිහිර ළමා පත්තරයට අවුරුදු පනහක් පිරිලා. ඇස් ඒ දිසානායක මහත්තයගෙ "යෝධයා" බූ සහ බබා පෙති හිටපු "ඔන්න බබො" වගේ චිත්‍ර කතා අපේ කල්පනා ලෝකය අවදි කළ හැටි අමතක වෙන්නෙ නැහැ. ඒ විදි රසය තවමත් දැනෙනවා. අවුරුදු 50ක් ගිහිල්ලත් එතුමා තවමත් ඒ කතා අඳිනවා.

ඒ වගේම මිහිර කියන්නෙ අද ඉන්න බොහෝ නිර්මාණකරුවන්ට ගොඩනැගෙන්නට අත දුන් පත්තරයක්. මිහිර පත්තරේ කවියක් කතාවක් පළ කරවාගනිමින් නිර්මාණ දිවිය ඇරඹූ අය කොයිතරම් ඉන්නවද? අවම වශයෙන් මිහිරි පාසල් වාර්තාකාරයෙක් හැටියටවත් ගමන ඇරඹූ අය කොයිතරම්ද?

හැත්තෑව දශකය අගභාගයේ පාසල් සිසුවකුව සිටියදී මාත් මිහිර පත්තරයට "පැංචා" නමින් කාටූන් එකක් ඇන්දා. ඒ කාලයේම මට වඩා ටිකක් වයසින් වැඩි අතුල මහවලගේ කියල සිසුවකුත් කාටූන් ඇන්දා මතකයි. අද අතුල කලා ලොවේ දැවැන්ත චරිතයක්. මේ වගේ කී දෙනෙක් නම් මිහිරෙන් ගොඩ එන්න ඇද්ද?

තවත් අවුරුදු පනහක් පවතින්නට මිහිර ට සුබ පතන්න කැමතියි.

# මහින්ද පරාජය කළ යුත්තේ ඇයි?

වික්ටර් අයිවන්
රාවය පුරෝගාමී කර්තෘ

ශ්‍රී ලංකාව සැළකුණේ එකම ලේ බිඳුවක්වත් නොසළා නිදහස ලබාගත් රටක් ලෙසිනි. නමුත් නිදහස ලැබීමෙන් පසු රට කෙළවරක් නැතිව ලේ හලන රටක් බවට පත්වුණි. නිදහස ලැබීමෙන් පසු මේ දක්වා ගෙවුණු කාලයෙන් අඩකට ආසන්න කාලයක් අපි ජීවත්ව ඇත්තේ ලේ මත සහ මළ මිනී මතය. ඊට බලපෑ කරුණු මොනවාද? ඒ තත්ත්වය ඇතිවූයේ වර්ගය, ආගම, කුලය, පත්තිය යන සියළු ශාඛක එක්තැන්වීමෙනි. මේ ගැටුම් නිසා මරණයට පත්වූ පිරිස රටේ ජනගහන අනුපාතයට බලන විට අති විශාල පිරිසකි. ඉතිරිව ජීවත්වන ප්‍රමාණයෙන් අති විශාල ප්‍රමාණයක් ජීවත් වන්නේ අධ්‍යාත්මික වශයෙන් මරණයට පත්වූ මිනිසුන් ලෙසිනි. අපි අපේ තරමට නොගැලපෙන තරම් ලේ හලන තත්ත්වයකට පත්වුණේ ඇයිද යන කාරණය අද දක්වාත් අපි බැරෑරුම් ලෙස සළකා බලා නොමැත.

වර්ගය, ආගම, කුලය වැනි ශාඛක එකට එකතුවී ගොඩ එන්න නුපුළුවන් වූයේ අපිට මේ රටේ එක්සත් ජාතියක් ගොඩනගාගන්නට නොහැකි වූ නිසා. එක්සත් ජාතියක් ගොඩනගා ගන්නේ කෙසේද යන ප්‍රශ්ණය නිදහසට පෙර සිට අද දක්වාම බැරෑරුම් ලෙස සාකච්ඡාවට ලක්කර නොමැති මාතෘකාවකි.

ආණ්ඩුක්‍රම තනාගැනීමේ ඉතිහාසයේත් අපි සිටින්නේ නුගාක් ශීලාචාර තැනක නොව නුගාක් පහළ තැනකය. අපි මේ දක්වා අපේ ව්‍යවස්ථා හදා ගත්තේ පිළිගත් සාරධර්ම සැළකිල්ලට ගෙන නොවේ. බෙහෙවින් හිතුවක්කාරව බලහත්කාරයෙනි. මෙතෙක් ක්‍රියාත්මක කළ කිසිම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රටේ අවශ්‍යතා සැළකිල්ලට ගෙන සාදන ලද ව්‍යවස්ථා නොවේ. සෝල්බරි ව්‍යවස්ථාව සාදන ලද්දේ ඩී.එස්. සේනානායකගේ අභිලාෂයත් සැළකිල්ලට ගනිමිනි. ඉන් පසු නිර්මාණය කෙරුණු 72 ව්‍යවස්ථාව මගින් සෝල්බරි ව්‍යවස්ථාව බරපතල ලෙස විකෘති කෙරිණ. 78 ව්‍යවස්ථාව මගින් එම විකෘතිය උපරිම තලයකට රැගෙන යන ලදි. මේ සියළු ව්‍යවස්ථාවල දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ ඒ සෑම ව්‍යවස්ථාවක් මගින්ම ජාතිය ගොඩනැගීම කියන විෂය මුළුමනින්ම අමතක කර තිබීම සේ සැළකිය හැකිය.

78 ව්‍යවස්ථාවෙන් ආණ්ඩු වෙනස් කිරීම බොහෝ කලාතුරකින්, ඉතා අමාරුවෙන්, දශක ගණනකට වරක් පමණක් සිදුවන දුෂ්කර ක්‍රියාවක් බවට පත්වී ඇත. පාර්ලිමේන්තු ක්‍රමය තුළ පැවති ශීලාචාරකම මුළුමනින්ම අහෝසි කර ඇත. ඊට පෙර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රජයේ ආයතන සමග ව්‍යාපාර කළ නොහැකි විය. එම තත්ත්වය අහෝසි කරමින් 78 ව්‍යවස්ථාව මන්ත්‍රීවරුන්ට රජයේ ආයතන සමග ව්‍යාපාරවල යෙදිය හැකි පරිසරයක් සාදා දුන්නේය. මත්පැන් බලපත්‍ර සහ නොයෙකුත් කොන්ත්‍රාත් ඔවුනට ලබාදුනි. එමගින් පාර්ලිමේන්තුව මහජනයා වෙනුවෙන් පෙනී සිටින ආයතනයක තත්ත්වයෙන් ඉවත් කර තමන්ගේ ජාවාරම්කාර ව්‍යාපාර වෙනුවෙන් පෙනී සිටින්නන්ගේ ආයතනයක් බවට පත් කළේය.

78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කළ හායානකම දේ එක් පුද්ගලයකු අත ආණ්ඩුවේ සකල විධ බලය කේන්ද්‍ර ගත කිරීමය. එපමණක් නොව එම පුද්ගලයා පාර්ලිමේන්තුවට වග කීමට බැඳී නැති, නීතියට යටත් නැති, ඒකාධිපති ව්‍යවස්ථාදායකයකු බවට පත්කළේය.

මේ සමස්ථ ආණ්ඩුක්‍රමයේම ඇති නරකම සහ ඉතාමත්ම අශීලාචාර දර්ශනය වන්නේ ආණ්ඩුක්‍රණය වස්තු කොල්ලයක් බවට පත් කිරීමය. 78 සිට අද දක්වා ආණ්ඩු රට පාලනය කරනවාට වඩා රටේ වස්තුව කොල්ලකෑම සිදුකර ඇත. රටක පාලකයන් තමන් බාරයේ ඇති වස්තුව කොල්ලකන්නේ නම් එවන් රටකට කිසිදාක ගොඩඒමක් නොමැත. එක්සත් ජාතික පක්ෂය මේ ව්‍යවස්ථාව නිර්මාණය කළේ කිසිම දිනෙක වෙනත් කිසිම පාර්ශ්වයකට බලයට ඒමට නොහැකි වන ආකාරයෙනි.

ගතවූ දශක හතර තුළ රටේ කැරැළි තුනක් ඇතිවිය. දකුණේ කැරැළි දෙකක් සහ උතුරේ කැරැල්ලක් වශයෙනි.
88-89 දකුණේ කැරැල්ල අධිකරණයේ පැවැති ඒ ස්වාධීනත්වය මුළුමනින්ම නැති කර දැමීමය.

පොදු පෙරමුණු ආණ්ඩුව කාලයේ සිංහල කැරැල්ලක් නොතිබුණත් ඒ වන විට ලොකු මහත්වි ඉදිරියට යන දෙමළ තරුණ කැරැල්ලක් තිබුණි. එය අපගේ සමාජ දේශපාලනය කෙරෙහි බලපෑවේය. කැරළි සංස්කෘතිය සහ ඒවා මර්ධනය කළ සංස්කෘතිය අපේ සමාජ දේශපාලනයේ මහා වෙනස්කම් ඇති කරනු ලැබීය. මන්ත්‍රීවරුන්ට සහ දේශපාලකයන්ට තර්ජණ එල්ල වන විට ආණ්ඩුව ඔවුන්ට පුද්ගලික හමුදාවක් හදාගැනීමට උපදෙස් දුන්නේය. ඒ පුද්ගලික හමුදාවල සාමාජිකයන් බවට පත්වූයේ රටේ නමගිය අපරාධකරුවන්ය. එමගින් රටේ අපරාධකරුවන් සහ දේශපාලකයන් කල්ලි ගැසී ක්‍රියාකරන තත්ත්වයක් ඇතිවිය. එය අද දක්වා පවතී. රටේ මෙතරම් අපරාධ සිදුවන්නේ ඇයි? රට තුළ මෙතරම් විශාල වශයෙන් මත් කුඩු ජාවාරම ක්‍රියාත්මක වන්නේ කෙසේද? හේතුව වටහා ගැනීම දුෂ්කර නැත. ඇත්තවශයෙන්ම අද රටේ දේශපාලකයා සහ අපරාධකරුවා වෙන්ව හඳුනාගත නොහැකි තරමට එකිනෙකාට බද්ධවී ඇත. මෙය අතිශය බේද ජනක තත්ත්වයකි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් එල්ටීටීඊ කැරැල්ල පරාජයට පත්වීමද රටේ අනාගතයට බලපෑ ඉතාම වැදගත් සිදුවීමකි. ඒ සමග රාජපක්ෂ ජනාධිපතිවරයා යෝධයකු බවටත් රටේ සිටින අනෙකුත් සියළු දේශපාලකයන් අඟුටුමිටිටන් බවටත් පත්විය. ඒ සිද්ධියෙන් සිංහල ජනයා උපරිම ලෙස උද්දාමයට පත්විය. ඒ තුළින් සිදුවූ වරදක් වන්නේ උද්දාමයේ තරංග වැදි සිංහල ජනතාවගේ ඇස් පෙනීම දුර්වලවීමය. එමෙන්ම අවිචාරවත් ලෙස වීරයා පසු පස යන ඇස් පෙනීම දුර්වල ජනතාවක් බවට සිංහල ජනතාව පත්වූහ.

**වීරයාවත් මෙය යම් විදිහකට නරක ආකාරයෙන් බලපෑවේය. මේ රට ගලවා ගත් මට මේ රට ණයගැතිය යන උද්දාමයක් වීරයාවද ඇතිවිය. වීරයාගේ ඇස් පෙනීමද දුර්වල වී හිතන මතන ආකාරය උද්දච්ඡභාවයේ උපරිමයට ගමන් කළේය. එල්ටීටීඊය පරාජය කරන හෙක් සිය කාර්යය ප්‍රශස්ථ ආකාරයෙන් කළ වීරයා ඉන් පසු ඇතිවන සමාජ ගැටළු දකින්නට අසමත් විය.**

රටක අභ්‍යන්තර සුද්ධයක් අවසන්වීමෙන් පසු මුහුණ දීමට සිදුවන සරළම ප්‍රශ්ණයක් වන්නේ වගවීමේ ප්‍රශ්ණයයි. අවම වශයෙන් ඒ ප්‍රශ්ණයවත් දුර දක්නා

37 වන පිටට

සටහන
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

පරාජය කරන්නට ආණ්ඩුව සමත්වුවද මිනිසුන් සිදුවූ දේ පිළිබඳ විශ්මයෙන් බලන්නට විය. වෙනත් කිසිම පාර්ශ්වයකට බලයට ඒමට නොහැකි වන සේ නිර්මාණය කළ 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වාදීමෙන් 17 වසරකට පසු ආණ්ඩු වෙනසක් ඇති වූයේ ඒ සුවිශේෂී වටපිටාව හේතුවෙනි. එය කිසියේත් ස්වාභාවිකව ක්‍රමානුකූලව සිදුවූ දෙයක් නොවිය. එවැනි පසුබිමක් තුළ පවා ආණ්ඩු වෙනසක් සිදුකර ගැනීමට මහත් වෙහෙසක් දැරීමට සිදුවිය.

**එලෙස මහත් වෙහෙසක් දරමින් බලයට පැමිණි පිරිස ආරම්භයේ සිටම කියා සිටියේ තමන් බලයට පත්වීමෙන් පසු මේ තුළින් ක්‍රමය තවදුරටත් පවත්වාගෙන නොයන බවය. එහෙත් ඒ දේ සිදුකරනු වෙනුවට ඒ පිරිසද පවතින ක්‍රමයේ රස උපරිමයෙන් උරා බීවේය.** එහි ඇති වෙනස නම් එක්සත් ජාතික පක්ෂයට මෙන් හයෙන් පහක බලයක් නොතිබුණු බැවින් ඒ අයගේ පාලනය පෙර පැවැති පාලනය තරම්ම දරදඬු නොවීමය. එහෙත් ඔවුන් අතින් ඉතාම බරපතල වරදක් සිදුවිය. එය හමි ඉතාම දරදඬු ආණ්ඩු ක්‍රමයක් පැවැති කාලයේ පවා විශාල ස්වාධීනත්වයකින් ක්‍රියා කළ මෙරෙට